සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

சூரிய சக்தி, காற்று மற்றும் நீர் மின்னுற்பத்தி கருத்திட்ட இராஜாங்க அமைச்சு

STATE MINISTRY OF SOLAR, WIND AND HYDRO POWER GENERATION PROJECTS DEVELOPMENT



වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2020

2020 වර්ෂය සඳහා
වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම :- සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය :- 406

අන්තර්ගතය :-

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

ඇමුණුම 01 - 2020 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

01.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් අනූන රටකි. මෙරට පුනර්ජනනීය බලශක්ති ජනනයෙහි සංවර්ධනය කර ඇති ප්‍රධාන ප්‍රභවය ජල බලය වේ. සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව (Non-Conventional Renewable Energy resources - NCRE) ලෙස සැලකෙන සුළං, සූර්ය බලය හා ජෛව ස්කන්ධ වැනි අනෙකුත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ද ජාතික විදුලි පද්ධතියට සම්බන්ධව ඇත.

වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන **"සෞභාග්‍යයේ දැක්ම"** තුළ 'පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය' දැඩි ලෙස අවධාරණය කර ඇත. වර්තමාන රජය පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය සඳහා ලබා දී ඇති ප්‍රමුඛත්වය, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා කටයුතු කළ යුතු රාජ්‍ය අමාත්‍යාංශයක් ස්ථාපනය කිරීම මගින් පිළිබිඹු වේ.

ඒ අනුව අංක 2187/27 දරන 2020 අගෝස්තු මස 09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපනය කරන ලදී.

පුනර්ජනනීය බලශක්ති ප්‍රවර්ධනය මගින් පොසිල ඉන්ධන භාවිතය ක්‍රමක්‍රමයෙන් අඩු කරමින් බලශක්ති සුරක්ෂිතතාවය අත්පත් කරගැනීමට රටට හැකි වනු ඇත. මෙමගින් හුදෙක් පිරිසිදු පරිසරයක් නිර්මාණය වීම පමණක් නොව ඉන්ධන ආනයන පිරිවැයෙහි අඩුවීමක් සිදුවී එමගින් අයවැය හිඟයේ අඩු වීමක් ද අපේක්ෂා කෙරේ. ඒ අනුව 2030 වර්ෂයේ විදුලිබල අවශ්‍යතාවයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මගින් සපුරා ගැනීම ඉලක්ක කර ඇත.

01.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

තිරසර ලෙස සංවර්ධිත බලශක්ති ක්ෂේත්‍රයක්.

මෙහෙවර

සූර්ය බලශක්තිය, ජලය, සුළං හා ජෛව ස්කන්ධ වැනි පුනර්ජනනීය ප්‍රභව ඔස්සේ විදුලි බලය ජනනය, සාමකාමී න්‍යෂ්ටික යෙදවුම් ප්‍රවර්ධනය හා උපයෝජනය, අයනීකෘත විකිරණ වලින් ජනතාව හා පරිසරය ආරක්ෂා කිරීම හා විදුලිබලය ආශ්‍රිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රයන් සඳහා නායකත්වය සැපයීම.

කාර්යයන් හා කර්තව්‍යයන්

විදුලිබල අමාත්‍යවරයාගේ උපදෙස් හා මග පෙන්වීම මත "අඩු වියදම් බලශක්තිය ලබාගැනීම සහතික කිරීම" සඳහා අදාළ නීති සහ අණපනත් වලට අනුකූලව සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති

සංවර්ධන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය හා ආයෝජන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

සුවිශේෂී ප්‍රමුඛතා

(1) කැලණිතිස්ස බලාගාරය ස්වාභාවික වායු ටර්බයින ආශ්‍රිත බලාගාරයක් බවට පත් කිරීම සහ කෙරවලපිටිය බලාගාරය පුළුල් කිරීම

(2) ජනනය කරන ලද විදුලිබලයේ කාර්යක්ෂමතාවය හා උපරිම භාවිතය සහතික කිරීම සඳහා සුහුරු ජාලයක් සංවර්ධනය කිරීම

(3) නිවාස, කාර්යාල හා කර්මාන්තශාලා සඳහා අඩු වියදම් විදුලි බලය ලබා ගැනීම සහතික කිරීමට සූර්ය බල පද්ධති භාවිතය දිරිමත් කිරීම

(4) කොළඹ ප්‍රදේශයේ පිහිටා ඇති සියලුම ඉන්ධන බලාගාර, ස්වාභාවික වායු ටර්බයින බලාගාර බවට පරිවර්තනය කිරීම

(5) ගෘහ කුටුම්භ හා කුඩා ව්‍යාපාර සඳහා අඩු වියදම් බලශක්තිය ලබාගැනීම සහතික කිරීම සඳහා වහල මත සවිකරන ලද සූර්ය කෝෂ පද්ධති භාවිතය දිරිමත් කිරීම

(6) පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීමට පෞද්ගලික අංශය හා ව්‍යවසායකයන් දිරිමත් කිරීම

(7) 2020 වන විට බ්‍රෝඩ්ලන්ඩ් ජල විදුලි බලාගාරය, 2021 වන විට උමාඔය, 2023 වන විට මොරගොල්ල හා 2024 වන විට තලපිටිගල හා සීතාවක ගඟ බලාගාර ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම

(8) 2021 වන විට මන්නාරම සුළං බලාගාරය මඟින් බලශක්තිය මෙගාවොට් 100 ක් සහ මන්නාරම, පූනරින් හා මොණරාගල ප්‍රදේශවල සුළං හා සූර්ය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමෙන් මෙගාවොට් 800 ක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම

01.3 සංවිධාන සටහන



01.4 අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය:
2007 අංක 35 දරන පනත මගින් ස්ථාපනය කරන ලදී.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව:
2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත යටතේ ස්ථාපනය කරන ලදී.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය :
2014 අංක 40 දරන ශ්‍රී ලංකා පරමාණුක පරමාණුක බලශක්ති පනත යටතේ ස්ථාපනය කරන ලදී.

01.5 අමාත්‍යාංශය තුළ පවතින අංශ

පාලන අංශය

පැවරී ඇති කාර්යයන් :

- අමාත්‍යාංශයට අදාල සියළුම පරිපාලන කටයුතු හා යටිතල පහසුකම් සංවර්ධනය
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු නිසි පරිදි පවත්වා ගෙන යාම, නඩත්තු කිරීම සහ කාර්ය සාධනය සම්බන්ධ කටයුතු
- මානව සම්පත් සංවර්ධනයට අදාල කටයුතු
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන සියළුම ව්‍යවස්ථාපිත ආයතනයන්හි ආයතනික කටයුතු අධීක්ෂණය කිරීම සහ අනෙකුත් විෂයන්ට අදාල කටයුතු
- අමාත්‍යාංශයේ සියළුම ප්‍රවාහන සේවා හා සියළුම නඩත්තු සේවා ඉටු කිරීම සම්බන්ධ කටයුතු

ගිණුම් අංශය

පැවරී ඇති කාර්යයන් :

- මෙහෙයුම් කාර්යයන් හා සංවර්ධන කාර්යයන් යටතේ වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන වලට අදාල වියදම් ගිණුම්ගත කිරීම සම්බන්ධව රාජ්‍ය මුල්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීම.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන, සංවර්ධන වැඩසටහන් යටතේ දේශීය අරමුදල් හා විදේශීය අරමුදල් උපයෝගි කරගනු ලබන ව්‍යාපෘතිවල වියදම් වාර්තා කරමින් ප්‍රතිපාදන ඉක්මවා නොයන පරිදි පාලනය කිරීම.

සංවර්ධන අංශය

පැවරී ඇති කාර්යයන් :

- පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම හා එම ප්‍රතිපත්ති ඉලක්ක සාක්ෂාත් කර ගැනීම.
- පුනර්ජනනීය බලශක්ති ජනනයන් ජාතික පද්ධතියට එකතු කර ගැනීමේ ගාස්තු නිර්ණය කිරීම.
- ව්‍යාපෘති මූල්‍යයනය සහ දායකත්ව සම්බන්ධීකරණය - බහුපාර්ශ්වීය සම්බන්ධීකරණය.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම.
- පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට අදාළ විදේශ ආයතන සමග සම්බන්ධීකරණය.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා පැමිණෙන විදේශීය කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වීසා ලබා දීම / වීසා කාලය දීර්ඝ කිරීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ ලබා දීම.
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සම්බන්ධීකරණය

02 වන පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

02.1 ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා පුනර්ජනනීය බලශක්ති ඉලක්ක

පුනර්ජනනීය බලශක්ති ප්‍රතිපත්තිය හා පුනර්ජනනිය බලශක්ති ඉලක්කයන්හි මූලික අරමුණ වන්නේ, ශ්‍රී ලංකාව සාධාරණ සමාජ සංවර්ධනයකට නතු කිරීම සඳහා උපකාර කරනු පිණිස පහසු, දැරිය හැකි මිලකට බලශක්ති සේවාවන් සැපයීම සඳහා පිරිසිදු, ආරක්ෂාකාරී, තිරසර, විශ්වාසදායී හා ආර්ථික වශයෙන් ශක්‍ය බලශක්ති සැපයුමක් පවත්වා ගැනීම සහතික කිරීමයි. අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය" අනුව, 2030 වර්ෂය වන විට මෙරට විදුලිබල අවශ්‍යතාවයෙන් උපරිම ප්‍රතිශතයක්, එනම් 70 % ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වලින් ලබා ගත යුතුය. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා විදුලිබල පනතේ ප්‍රතිපාදන අනුව, ලංවිම දිගු කාලීන ජනන සැලසුම සකස් කරනු ඇත.

02.2 පුනර්ජනනීය බලශක්ති දායකත්වය ඉහල නැංවීම

ජාතික විදුලිබල පද්ධතියේ ස්ථාපිත විදුලි ජනන ධාරිතාව 2020 වර්ෂයේදී මෙගා වොට් 4,621 ක් වන අතර එහි පුනර්ජනනීය බලශක්ති දායකත්වය 54 % කි. ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ ප්‍රධාන පුනර්ජනනීය විදුලි උත්පාදන ප්‍රභවය ජල විදුලියයි. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (NCRE) ලෙස හඳුන්වන කුඩා ජල විදුලි, සුළං, සූර්ය, ඩෙන්ඩ්‍රෝ සහ ජෛව ස්කන්ධ වැනි අනෙකුත් පුනර්ජනනීය ප්‍රභවයන් ද පද්ධතියට සම්බන්ධ කරනු ලබයි. දේශීය ප්‍රජාව බලශක්ති ක්ෂේත්‍රයේ කර්මාන්තයන්හි නිරත කරවීමේ හා තිරසාරත්වය ළඟා කර ගැනීමේ අරමුණ ඇතිව, පහත දැක්වෙන උපාය මාර්ග අනුගමනය කිරීමෙන් පරිසර හිතකාමී බලශක්ති මූලාශ්‍ර භාවිතය ප්‍රවර්ධනය කිරීමේ පියවරක් ලෙස විදේශ විනිමය පිඩනය අඩු කිරීම සඳහා ජාතික බලශක්ති සැපයුමෙහි පුනර්ජනනීය බලශක්ති සම්පත්වල දායකත්වය ඉහල නංවා ඇත.

ප්‍රභවය		ධාරිතාව (මෙගා වොට්)	විදුලි බලාගාර සංඛ්‍යාව
ප්‍රධාන ජල විදුලිය		1,399	17
පුනර්ජනනීය බලශක්ති			
	කුඩා පරිමාණ ජල විදුලි	422.97	211
	සුළං	248.45	18
	සූර්ය	70	27
	ඩෙන්ඩ්‍රෝ හා ජෛව ස්කන්ධ	38.11	12
	සූර්ය පියසි	337	
එකතුව		**2,515.53**	**285**

2020 දෙසැම්බර් අවසානය වන විට ගිගාවොට් පැය 16,304 ක විදුලිය ජනනය කර ඇත. සමස්ත ජනනයෙන් 24% ක්ම ජල විදුලිය (කුඩා ජල විදුලි බලාගාර නොමැතිව) වේ. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති (NCRE) ප්‍රභව වන කුඩා ජල විදුලි, සූර්ය, සුළං සහ ජෛව ස්කන්ධ දායකත්වය 9%කි. සූර්ය පියසි විදුලි ජනනයේ දායකත්වය, බලශක්ති සංයුතියෙන් 2%කි.

02.3 ප්‍රධාන ජල විදුලි බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

මොරගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 31)

මොරගොල්ල ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය මහනුවර දිස්ත්‍රික්කයේ උලපනේ ප්‍රදේශයේ පිහිටා ඇති අතර එය මහවැලි ගංගා ද්‍රෝණියේ ඉදි කරමින් පවතී. මෙමගින් වාර්ෂිකව ගිගාවොට් පැය 100ක බලශක්තියක් ජනනය කිරීමට අපේක්ෂිත ය. මෙම ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් 2017 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් මිලියන 113.86 ක ණය ප්‍රදානයක් "හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන" යටතේ ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතියේ මූලික වැඩකටයුතු 2018 වර්ෂයේ දී ආරම්භ වූ අතර, ව්‍යාපෘතියේ වර්තමාන භෞතික ප්‍රගතිය 27 %කි. රට තුළ දැනට උද්ගත වී ඇති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය මන්දගාමී වී ඇත. 2023 නොවැම්බර් මාසය වන විට ව්‍යාපෘතියේ කටයුතු නිමකර විදුලි ජනනය ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 35)

බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතියේ ස්ථාපිත ධාරිතාව මෙගාවොට් 35 ක් වනු ඇති අතර වාර්ෂිකව ගිගාවොට් පැය 126 ක විදුලි බලයක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ජල විදුලි බලාගාරය කෑගල්ල දිස්ත්‍රික්කයේ කිතුල්ගල ආසන්නයේ පිහිටුවා ඇත.

මෙම ව්‍යාපෘතියේ මුල් සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 82කි. පිරිවැයෙන් 85%ක් චීනයේ කාර්මික හා වාණිජ බැංකුවෙන් (ICBC) ලබාගන්නා ණය මුදලකින් ආවරණය වන අතර ඉතිරි 15% ශ්‍රී ලංකාවේ හැටන් නැෂනල් බැංකුවෙන් ලබා ගන්නා ණය මුදලකින් ආවරණය කරගනු ලැබේ. එසේ වුවද, ICBCහි ණය මුදලේ වලංගුතාවය 2019.12.16 වන දිනෙන් අවසන් වූ බැවින්, ලංවිම මගින් ඉතිරි වැඩ කටයුතු නිමකිරීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා මහජන බැංකුව සමඟ සාකච්ඡා කර ඇත.

මෙම ව්‍යාපෘතියේ කටයුතු වලින් 79%ක් නිම වී ඇති අතර 2021 ජුනි මාසයේදී විදුලි ජනන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

උමා ඔය ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 120)

බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රදේශයේ පිහිටා ඇති උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. අපේක්ෂිත වාර්ෂික බලශක්ති නිෂ්පාදනය ගිගාවොට් පැය 290කි. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 514කි.

මේ වන විට ඉදි කිරීම් කටයුතුවලින් 96%ක් පමණ නිමවී ඇත. 2021 දෙසැම්බර් මස වන විට මෙම ව්‍යාපෘතිය නිමකර ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත ය.

සීතාවක ගඟ ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 14)

කැලණි ගඟේ අතු ගංගාවක් වන සීතාවක ගඟ ආශ්‍රිතව කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇති මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය අනුව ව්‍යාපෘති පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 80 ක් වනු ඇති බවට ගණන් බලා ඇත. මෙගාවොට් 20 ක ජල විදුලි බලාගාරයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද නමුත් ලංකා විදුලිබල මණ්ඩලයේ මතය වනුයේ මෙම ව්‍යාපෘතිය ඉහත ඇස්තමේන්තුගත පිරිවැය මත ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිලාභ අඩු වනු ඇති බව යි. එබැවින්, මෙම ව්‍යාපෘතිය මෙගා වොට් 14ක (මෙ.වො 07 x 2) කුඩා පරිමාණ ජලවිදුලි බලාගාරයක් ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ පාලිත ආයතනයක් වන ශ්‍රී ලංකා එනර්ජීස් පුද්. සමාගම මගින් නැවත ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරමින් පවතී.

තල්පිටිගල ජලවිදුලි බලාගාර ව්‍යාපෘතිය (මෙගා වොට් 15)

මෙම ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරේ. චීන එක්සිම් බැංකුව සමග ණය ගිවිසුම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් අත්සන් කර ඇත. ව්‍යාපෘතියේ නිර්මාණ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදු කර ඇත. ව්‍යාපෘතිය සඳහා IEE අනුමැතිය ලබාගෙන ඇත. නැවත පදිංචි කිරීමේ ඉඩම් හඳුනාගෙන ඇත. වන්දි ගෙවීම හා ඉඩම් අත්පත් කර ගැනීම සිදු කරමින් පවතී. සමාජීය ආර්ථික අධ්‍යයනය හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදු කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය නිම කර 2024 වර්ෂයේදී ජාතික පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිතය.

02.4 සුළං විදුලි බලය

මන්නාරම සුළං විදුලිබල උද්‍යානය (මෙගා වොට් 300)

ශ්‍රී ලංකාවේ ප්‍රථම මහා පරිමාණ සුළං බල උද්‍යානය මන්නාරම සුළං බල උද්‍යානය වන අතර එය මන්නාරම දූපතේ දකුණු වෙරළ තීරයේ පිහිටා ඇත. පළමු පියවර ලෙස මෙගාවොට් 100ක සුළං විදුලි බලයක් නිපදවා ඇත. මෙගාවොට් 3.45 ධාරිතාවකින් යුත් අති නවීන සුළං ටර්බයින් 30කින් මෙම ව්‍යාපෘතිය සමන්විත වන අතර මෙම උද්‍යානයේ සමස්ත ස්ථාපිත ධාරිතාවය මෙගාවොට් 103.5කි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අන්තර් මෝසම් සුළං පද්ධතිවල ශක්තියෙන් ප්‍රයෝජන ලබා ගැනීම සඳහා මෙය ඉදි කරන ලදී. වාර්ෂිකව ගිගාවොට් පැය 400ක විදුලි ධාරිතාවයක් ජනනය කිරීමට අපේක්ෂිත ය.

මෙම ව්‍යාපෘතියේ සමස්ත ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 200ක් වන අතර ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලද ණය මුදල මගින් ඉදි කිරීම් සිදු කරනු ලැබේ. 2019 මාර්තු මස ආරම්භ කළ මෙම ව්‍යාපෘතියේ මුල් අදියර අවසන් කර 2020 දෙසැම්බර් 08 දින සිට "තම්බපවනි" සුළං විදුලි බලාගාරය නමින් ක්‍රියාත්මක වන අතර, මේ වන විට මෙගා වොට් 30ක ධාරිතාවක් පද්ධතියට එක් කර ඇත. බලාගාරයේ ඉතිරි මෙගා වොට් 70, 2021 වර්ෂයේ අප්‍රේල් මාසයේදී පද්ධතියට එක් කිරීමට අපේක්ෂිතය.

ආසියානු සංවර්ධන බැංකුවේ ණය මුදලේ ඉතිරිය මෙම ස්ථානය තුළම අතිරේක මෙගාවොට් 20ක ටර්බයින ස්ථාපනය කිරීමට උපයෝගී කරගනු ඇත.

මෙම සුළං බල උද්‍යානයේ දෙවන අදියර ලෙස, අතිරේක මෙගාවොට් 200ක සුළං විදුලිබල ජනනයක් පුද්ගලික ආයෝජන ඔස්සේ සිදුකිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මන්නාරම්

දූපතේ හඳුනාගත් ඉඩම්වල මැනුම් කටයුතු ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සිදුකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරගෙන යනු ලැබේ.

පූනරින්හි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති උද්‍යානය (සුළං මගින් - මෙගා වොට් 240 හා සූර්ය බලයෙන් - මෙගා වොට් 150)

දකුණු ආසියාවේ වැඩිම සුළං බල ශක්ති විභවයක් සහිත ප්‍රදේශයක් ලෙස පූනරින් සැලකේ. පුද්ගලික ආයෝජන යටතේ මෙම උද්‍යානයේ මෙගාවොට් 240 ධාරිතාවෙන් යුත් සුළං බලාගාරයක් හා මෙගාවොට් 150 ධාරිතාවෙන් යුත් සූර්ය බලාගාරයක් ඉදි කිරීමට සැලසුම් කර ඇත.

මෙම විදුලිබල උද්‍යානය ඉදි කිරීම සඳහා අවශ්‍ය භූමිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් හඳුනාගනු ලැබ මැනුම් කටයුතු සිදු කර ඇත. පූර්ව ශක්‍යතා අධ්‍යයනය හා කුරුල්ලන් හා වවුලන් සම්බන්ධ සමීක්ෂණය ද අවසන් කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) විසින් යෝජනා කැඳවීම (RFP) සඳහා අවශ්‍ය ලේඛන පිළියෙළ කර ඇති අතර, 2021 අගෝස්තු මාසයට පෙර යෝජනා කැඳවීමට අපේක්ෂිතය. ආසියානු සංවර්ධන බැංකුව විසින් පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුව (ESIA) හා භූ-තාක්ෂණ සමීක්ෂණය සිදුකිරීම සඳහා මූල්‍ය සහයෝගිතාවය පිරිනැමීමට එකඟතාවය පළකර ඇත.

චුන්නාකම් සුළං විදුලි බලාගාරය (2 X මෙගාවොට් 10)

මෙගාවොට් 10 ධාරිතාවයේ සුළං විදුලිබල බලාගාර ද්විත්වයක ඉදිකිරීම් කටයුතු නිමකර ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම 2020 ජූනි මස සිදු කරන ලදී. මෙහි වාණිජ මෙහෙයුම් කටයුතු ස්වාධීන විදුලි බලාගාර (IPP) ලෙස සිදුකෙරේ.

කුඩා පරිමාණ සුළං විදුලි බලාගාර (මෙගාවොට් 60)

පුද්ගලික අංශයේ ආයෝජන උපයෝගී කරගනිමින් මන්නාරම, බෝලවත්ත, මාදම්පේ, කප්පල්තුරෙයි හා ත්‍රිකුණාමලය වැනි ප්‍රදේශවල මෙගාවොට් 60 ක සමස්ත ධාරිතාවයක් (මෙගාවොට් 1-10 දක්වා වූ ධාරිතාවයේ සුළං බලාගාර) සහිත සුළං විදුලි බලාගාර පිහිටුවීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. ත්‍රිකුණාමලය සුළං විදුලි බලාගාර සඳහා 2021 ජනවාරි මාසයේදී ටෙන්ඩර් ප්‍රදානය කිරීමට නියමිත අතර, මන්නාරම හා මාදම්පේ බලාගාර සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

02.5 සූර්ය විදුලි බලය

සූර්ය බල සංග්‍රාමය - වහල මත සූර්ය පැනල සවි කිරීමේ වැඩසටහන

මෙම වහල මත සූර්ය පැනල සවි කිරීමේ වැඩසටහන 2009 වර්ෂයේදී හඳුන්වා දුන් අතර, විදුලිය මිල දී ගැනීමේ ක්‍රමවේදය 2016 වර්ෂයේ දී හඳුන්වා දෙනු ලැබුවේ පුනර්ජනනීය බලශක්ති පාදක බලශක්ති ජනනය ශ්‍රී ලංකාව තුළ ප්‍රවලිත කිරීමටත්, එමගින් අඩු පිරිවැයකින් විදුලිය ලබා දීමත් මගින් සමාජයේ විවිධ ස්ථරවලට උපකාර කිරීමේ අභිලාෂයෙනි.

කිලෝවොට් 50 ධාරිතාවය දක්වා වහල මත සූර්ය බල පද්ධති ස්ථාපනය කිරීම සඳහා ණය ආධාර ලබා ගැනීමට 2019 වර්ෂයේ දී ආසියානු සංවර්ධන බැංකුවේ ඇමරිකානු ඩොලර් මිලියන 50ක මූල්‍යයන

පහසුකමක් යටතේ රජය විසින් ගෘහස්ථ, කාර්මික හා වාණිජ ආයතන යන කාණ්ඩ සඳහා අඩු පොලී ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. 2020 වර්ෂයේ අවසානය වන විට, දිවයින පුරා විසිරි 30,149වූ පද්ධති ඔස්සේ වහල මත සවි කරන ලද සූර්ය බල පද්ධති මගින් මෙගාවොට් 337ක සමස්ත ධාරිතාවයක් ජාතික විදුලිබල පද්ධතියට එක් වී තිබුණි.

කුඩා පරිමාණ භූමිය මත ස්ථාපිත සූර්ය විදුලිබලාගාර (මෙගාවොට් 1 X 35 සහ මෙගාවොට් 1 X 70)

මෙම ව්‍යාපෘති ද්විත්වය ඔස්සේ, ඒකක ධාරිතාවය මොගාවොට් 1ක් වන කුඩා බලාගාර ලෙසින් භූමිය මත ස්ථාපනය කෙරෙන සූර්ය විදුලි බලාගාර පුද්ගලික ආයෝජන ඔස්සේ ස්ථාපනය කරනු ඇත. එහි සමස්ත ධාරිතාවය මෙගාවොට් 105 ක් වේ. මෙයින් බලාගාර 31ක් ස්ථාපනය කිරීමේ කටයුතු නිමකර ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත. බලාගාර 75ක ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර 2021 දෙසැම්බර් මාසයේ දී එම කටයුතු නිම කිරීමට අපේක්ෂා කෙරේ. සැලසුම් කර තිබූ ඉතිරි බලාගාර සම්බන්ධයෙන් සැලකූ විට ඉඩම් අයිතිය, විවිධ ආයතනවලින් ලබාගත යුතු අනුමැතීන් අපේක්ෂාවෙන් සිටීම, මූල්‍ය ගැටලු ආදී ගැටලුවලට ඒවා මුහුණු දී සිටියි. එම ගැටලු විසඳීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් අවධානය යොමු කර ඇත.

මෙගාවොට් 10 ධාරිතාවයේ පොලොන්නරුව (කදුරුවෙල) සූර්ය බලාගාරය ක්‍රියාත්මක කරනුයේ කෝමාරිකා වගාවක්ද සමගිනි. 2020 වර්ෂයේ දී මෙහි ටෙන්ඩරය ප්‍රදානය කරන ලද අතර මෙහෙයුම් කටයුතු 2022 වර්ෂය වනවිට ආරම්භ කරනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

මෙගාවොට් 01 සිට10 දක්වා ධාරිතාවයේ සූර්ය බලාගාර (සමස්ත ධාරිතාවය මෙගා වොට් 150)

මෙගාවොට් 01 සිට 10 දක්වා පරාසයේ ධාරිතාවයෙන් යුතුව සමස්ත ධාරිතාවය මෙගාවොට් 150ක් වන සූර්යබල විදුලි ව්‍යාපෘති පුද්ගලික ආයෝජන යටතේ ආරම්භ කිරීමට යෝජිතය. මෙගා වොට් 147ක ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීම 2021 මාර්තු මස වන විට සිදු කිරීමට අපේක්ෂිතය.

මෙගාවොට් 20 ධාරිතාවයේ සූර්ය බලාගාර - වාලච්චේන (මෙගා වොට් 10) සහ වවුනතිවු (මෙගා වොට් 10)

වාලච්චේන හා වවුනතිවු යන ප්‍රදේශවල මෙගාවොට් 10 ධාරිතාවයේ සූර්යබල බලාගාර දෙකක ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත ය. දැනට අවශ්‍ය ඉඩම් ලබාගැනීමට අවශ්‍ය කටයුතුවල නිරත වී සිටී. මෙම සූර්ය බලාගාර දෙක 2022 වර්ෂයේදී පද්ධතියට එක් කිරීමට අපේක්ෂිතය.

සියඹලාණ්ඩුව සූර්යබල උද්‍යානය (මෙගා වොට් 100)

මෙගාවොට් 100 ක ධාරිතාවයකින් යුතුව මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පිහිටුවන සූර්ය බල උද්‍යානය, ශ්‍රී ලංකාවේ පළමු මහා පරිමාණ සූර්ය බල උද්‍යානය වනු ඇත. උද්‍යානය ක්‍රියාත්මක කිරීම සඳහා අක්කර 500ක ඉඩමක් හඳුනාගෙන ඇත. පූර්ව-ශක්‍යතා අධ්‍යයනය සිදුකර ඇති අතර දැනට පාරිසරික ඇගයීම සිදුකර ගෙන යමින් පවතී. මෙම ව්‍යාපෘතියේ මූල්‍ය හා තාක්ෂණික කරුණු විශ්ලේෂණය හා යෝජනා කැඳවීමේ ලේඛන සැකසීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදේ. සම්ප්‍රේෂණ පහසුකම් ද අන්තර්ගත කරමින් ආසියානු සංවර්ධන බැංකුව විසින් ව්‍යාපෘතිය සඳහා ව්‍යාපාරික ආකෘතියක් සකසා ඇත. මෙම ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව ගිගාවොට් පැය 148 ක් ජනනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඉන්දීය ණය ආධාර යටතේ සූර්ය බල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සූර්ය බල සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ඉන්දියානු එක්සිම් බැංකුව මඟින් ඇමරිකානු ඩොලර් මිලියන 100ක ණය ප්‍රදානයක් සිදුකිරීම සඳහා ඉන්දීය රජය එකඟ වී ඇත. රජයේ ගොඩනැගිලි සඳහා වහල මත සවිකෙරෙන සූර්ය පැනල ක්‍රියාත්මක කිරීම, පාවෙන සූර්ය බල ව්‍යාපෘති පිළිබඳ පර්යේෂණ කිරීම හා අඩු ආදායම්ලාභී පවුල් සඳහා බලශක්ති ගබඩාකරණ පහසුකම් සහිතව සූර්ය බල කට්ටල හඳුන්වා දීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදුකිරීමට අපේක්ෂා කෙරේ. 2021 මුල්භාගයේ දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

02.6 කුඩා පරිමාණ ජල විදුලි බලාගාර

මෙගාවොට් 11.84 ධාරිතාවයකින් යුක්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාර පුද්ගලික ආයෝජන යටතේ ඉදි කෙරෙමින් පවතින අතර 2021 මැද භාගයේදී ජාතික විදුලි බල පද්ධතියට එක් කිරීමට අපේක්ෂිත ය. තව ද මෙගාවොට් 12.4 ධාරිතාවයකින් යුක්ත කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 2021 අවසාන භාගයේ දී ජාතික විදුලි බල පද්ධතියට සම්බන්ධ කරනු ඇත.

02.7 පෙව ස්කන්ධ බලාගාර

වර්තමානයේ දී බලාගාර 12ක් ඔස්සේ මෙගාවොට් 38.11 ධාරිතාවක් ජාතික විදුලි බල පද්ධතියට එක්වන අතර 2021 වනවිට මෙගාවොට් 10ක් ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීමට අපේක්ෂිත ය.

02.8 කසළවලින් බලශක්තිය

දිවයින තුළ පිහිටි කසළවලින් විදුලිය ජනනය කිරීමේ බලාගාර දෙකක් සඳහා බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් (PPA) ලංකා විදුලිබල මණ්ඩලය අත්සන් කර ඇත. මෙගා වොට් 10 ධාරිතාවයකින් යුතු මුතුරාජවෙල පිහිටි කසළවලින් විදුලිය ජනනය කිරීමේ බලාගාරය ඉදි කරමින් පවතින අතර එහි වාණිජ මෙහෙයුම් කටයුතු 2021 පෙබරවාරි මාසයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. මෙගාවොට් 10 ධාරිතාවයකින් යුතු කරදියාන පිහිටි කසළවලින් විදුලිය ජනනය කිරීමේ බලාගාරයේ ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂා කෙරේ.

02.9 ඩීසල් දහන තාප විදුලි බලාගාර, ද්‍රවීකෘත ස්වාභාවික වායු (LNG) බලාගාර බවට පරිවර්තනය කිරීම

ශ්‍රී ලංකාව තුළ ද්‍රවීකෘත ස්වාභාවික වායු වාණිජ මට්ටමේ මෙහෙයුම් කටයුතු 2024 වර්ෂයට පෙර ආරම්භ කිරීමට යෝජිත ය. මෙහිදී රට තුළ ද්‍රවීකෘත ස්වාභාවික වායු පහසුකම් සාර්ථකව ස්ථාපනය කිරීමෙන් අනතුරුව දැනට ක්‍රියාත්මක වන ඩීසල් / බැර ඉන්ධන දහන තාප බලාගාර, ද්‍රවීකෘත ස්වාභාවික වායු බලාගාර බවට පරිවර්තනය කිරීමට අපේක්ෂා කෙරේ.

ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයුම හා යටිතලපහසුකම් සංවර්ධනය

යෝජිත විදුලි බලාගාර සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීමට පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය.

පාවෙන ප්‍රතිවායුකරන ගබඩාකරණ ඒකකයක් හා නළ පද්ධතියක්, ඉදිකිරීම, අයිතිය හා මෙහෙයුම් (BOO) ක්‍රමවේදය යටතේ කෙරවළපිටිය ප්‍රදේශයේ ලංවිම මගින් ස්ථාපනය කිරීම.

මේ සඳහා පුද්ගලික අංශයේ ආයෝජන සඳහා යෝජනා කැඳවීමේ ලේඛන (RFP) ආසියානු සංවර්ධන බැංකුවේ උපදේශකයින්ගේ සහය ඇතිව ලංවිම මගින් පිළියෙල කරනු ලබයි. එ අනුව 2021 වර්ෂය තුළ මෙම ව්‍යාපෘති යෝජනා කැඳවනු ඇත.

පාවෙන ප්‍රතිවායුකරන ගබඩාකරණ ඒකකයේ සිට විදුලි බලාගාර දක්වා ද්‍රවීකෘත ස්වභාවික වායු නල මාර්ගයක් ඉදි කිරීම.
නල මාර්ගය ඉදි කිරීම සම්බන්ධයෙන් වන වගකීම ලංකා ඛනිජතෙල් සංස්ථාව මගින් දරනු ලබයි.

ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීම

විදුලි බලාගාරවලට ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයීම සඳහා වර්ෂ 05කට අදාළව විශේෂ බලපත්‍රයක් බලශක්ති අමාත්‍යවරයා විසින් ලංවිම වෙත ලබා දෙනු ලබයි. මෙම ව්‍යාපෘතිවල වාණිජ මෙහෙයුම් 2024 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය.

02.10 අභියෝග

- විදුලිබල ක්ෂේත්‍රයේ මූල්‍ය තත්ත්වය
- ඉදිකිරීම් සිදු කරමින් පවතින විදුලි බලාගාර නියමිත කාලයට ක්‍රියාත්මක කිරීම
- ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) සැපයුම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- ආංශික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම
- පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සඳහා නව තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම (සුහුරු මනු, සුහුරු ජාල සංකල්ප)
- පුනර්ජනනීය බලශක්ති සංකලනයේදී ජාලයට ආධාර වන උපයෝගී පද්ධති ප්‍රමාණවත් නොවීම නිසා වන තාක්ෂණික අභියෝග

02.11 අනාගත අරමුණු

- 2030 වර්ෂය වන විට මෙරට විදුලිබල අවශ්‍යතාවයෙන් 70%ක්, පුනර්ජනනීය බලශක්ති ඇතුළු වඩා පරිසර හිතකාමී පිරිසිදු බලශක්ති ප්‍රභව වලින් ලබා ගැනීම
- සුහුරු ජාල සංකල්පය (Smart Grid concept) ක්‍රියාත්මක කිරීම
- විශේෂිත පුනර්ජනනීය බලශක්ති ජනන තාක්ෂණයන් කරා යොමු වීම
- වෙරළාසන්න මුහුදු තීරයේ සුළං බලාගාර ඉදි කිරීම
- පුනර්ජනනීය බලශක්ති ගබඩා පහසුකම් මෙරට තුළ ඇති කිරීම
- දිය මත පාවෙන සූර්ය බලාගාර ඉදි කිරීම

03 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

03.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ -එෆ්

2020.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය (2020)		සටහන	තත්‍ය 2020	තත්‍ය 2019	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදාම් බදු	**1**	-	-	ඒසීඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	**4**	-	-	
-	**මුළු ආදයම් ලැබීම් (අ)**		-	-	
-	**ආදයම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		8,840,000	-	ඒසීඒ -3
-	තැන්පතු		-	-	ඒසීඒ -4
-	අත්තිකාරම් ගිණුම්		685,347	-	ඒසීඒ - 5/5(අ)
-	වෙනත් ලැබීම්		85,449	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**9,610,796**	-	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**9,610,796**	-	
	අඩු කළා: වියදම				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
-	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	15,042,103	-	

-	අනෙකුත් භාණ්ඩ හා සේවා සහනාධාර, සහනාධාර	6	8,350,046	-	ඒසිඒ - 2(II)
-	ප්‍රදාන සහ මාරු කිරීම්	7	233,265,097	-	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
-	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**256,657,246**	-	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	-	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	1,849,246	-	-
-	ප්‍රාග්ධන පැවරීම්	12	241,110,009	-	ඒසිඒ - 2(II)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
-	හැකියා වර්ධනය	14	16,000	-	
-	වෙනත් මූලධන වියදම්	15	35,463,911	-	
-	**මුළු මූලධන වියදම් (ඉ)**		**278,439,166**	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**5,192,574**	-	
	තැන්පතු ගෙවීම්		-	-	**ඒසිඒ -4**
	අත්තිකාරම් ගෙවීම්		5,192,574	-	ඒසිඒ - **5/5(අ)**
	මුළු වියදම උ = (ඇ+ඉ+ඊ)		540,288,985	-	
-	**2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		(530,678,190)	-	

03.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය **ඒසීඒ -පී**

	සටහන	තත්‍ය 2020 රු.	2019 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	**ඒසීඒ -6**	-	-
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	**ඒසීඒ -5/5(අ)**	4,507,226.60	-
මුදල් හා මුදල් සමාන දෑ	**ඒසීඒ -3**	-	-
මුළු වත්කම්		**4,507,226.60**	**-**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
ශුද්ධ වත්කම්		4,507,226.60	-
දේපළ, පිරියත හා උපකරණ සංචිතය		-	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ -5(ආ)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	**ඒසීඒ -4**	-	-
අග්‍රිම ශේෂය	**ඒසීඒ -3**	-	-
මුළු වගකීම්		**4,507,226.60**	**-**

පිටු අංක 00.....සිට 55..... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 56..... සිට 65..... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ගණකාධිකාරී/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 25/02/2021	දිනය : 25.02.2021	දිනය : 25/02/2021
වසන්තා පෙරේරා ලේකම් විදුලිබල අමාත්‍යාංශය	හේමන්ත සමරකෝන් ලේකම් සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය නො. 72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07	වී.හේ.ස. ජීවන්ත කීර්තිනායක ගණකාධිකාරී සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

03.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තක්‍ෂ	
	2020	**2019**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදයම් නොවන ලැබීම්		
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතුකරන ලද ආදායම්	85,449	
අග්‍රිම ලැබීම්	8,840,000	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)	**8,925,449**	**-**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	7,088,426	-
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	33,977	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**7,122,403**	**-**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**1,803,046**	**-**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම උපණය අය කර ගැනීම	-	-
අත්තිකාරම් අය කර ගැනීම	62,201	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**62,201**	**-**
අඩු කළා - මුදල් වැය කිරීම්:		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	1,865,246	-
අත්තිකාරම් ගෙවීම්		
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**1,865,246**	**-**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(1,803,046)**	**-**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**0**	**-**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
<u>අඩු කළා - මුදල් වැය කිරීම්:</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

03.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

03.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	පොළී ආදායම්	14.7	14.7	14.7	100%
20.04.01.00	සමාජ සංරක්ෂණ දායක මුදල්	70.7	70.7	70.7	100%

03.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	275,565	275,565	256,657	93.14
ප්‍රාග්ධන	463,250	464,750	278,439	59.91

03.8 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
නැත						

03.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	නැත.			
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

03.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

කරුණාකර ඇමුණුම 01 බලන්න.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

04.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

රාජ්‍ය අමාත්‍යාංශය පිහිටවූ පසු නව ක්‍රියාකාරී සැලැස්මක් සකස් නොකරන ලද අතර, 2020 වර්ෂය සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය වෙනුවෙන් සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්ය සාධනය

05.1 හඳුනාගත් අදාළ තිරසර සංවර්ධන අරමුණු

අරමුණ / පරමාර්ථය	ඉලක්ක	කාර්ය සාධන දර්ශකය	ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සියළු දෙනා සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසාර හා නවීන බලශක්තියක් සඳහා ප්‍රවේශය සුරක්ෂිත කිරීම.	100%ක ගෘහස්ථ විදුලියන මට්ටම සඳහා විදුලි බෙදාහැරීම් ජාලය වර්ධනය කිරීම හා ඉහල ගුණාත්මකභාවයෙන් යුත් විදුලි සැපයුම	රට තුළ විදුලියන මට්ටම			99.9%
	වර්ෂ 2030 වන විට, පුනර්ජනනීය බලශක්ති දායකත්වය, සමස්ත ජනන සංයුතියෙන් 70% ක් දක්වා ඉහල දැමීම	සමස්ත බලශක්ති සංයුතිය තුළ පුනර්ජනනීය බලශක්ති ජනනයේ දායකත්වයේ ප්‍රතිශතය		70%	
	සූර්ය පියසි සංවර්ධනය පුළුල් කිරීම මගින්, විදුලි ජනනය සඳහා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ඉහල නැංවීම.	වසර 2020 වන විට මෙගා වොට් 200ක සූර්ය පියසි බලශක්ති ධාරිතාවක් ජාතික ජාලයට සම්බන්ධ කිරීම.			100%
	කාර්යක්ෂම උපාංග භාවිතය තුළින් බලශක්තිය ඉතිරි කර ගැනීම (ශක්ති LED පහන් වැඩසටහන)	වසර 2022 වන විට ගිගා වොට් පැය 432ක බලශක්ති ඉතිරිය	10%		
	"ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" ප්‍රකාශයට පත් කරන ලදී.	"ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" සංග්‍රහය 2019 වර්ෂයේදී සම්පූර්ණ කරන ලදී.			100%
	රටෙහි විදුලි ඉල්ලුමෙන් 70%ක්, පුනර්ජනනීය බලශක්තිය ද ඇතුළු පරිසර හිතකාමී පිරිසිදු බලශක්ති ප්‍රභවයන් මගින් සපුරා ගැනීම	සමස්ත බලශක්ති සංයුතියෙන් 20 % ක් පිරිසිදු බලශක්ති ප්‍රභවයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු භාවිතයෙන් ජනනය කිරීම	10%		

05.2 තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සහ අභියෝග පිළිබඳ කෙටි විස්තරය

ජයග්‍රහණ

1. 2019 වර්ෂයේදී ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රතිපත්ති සංග්‍රහය, පහත කරුණු ඉටු කර ගැනීම සඳහා දායක වනු ඇත.
   - ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන මත යැපීම ප්‍රාථමික බලශක්ති සැපයුමෙන් 50%කට අඩු මට්ටමකට පහත හෙළීම සහ සියළු පාරිභෝගිකයින් එම නිශ්චිත බලශක්තිය භාවිතා කිරීම, වසර 2015 පවතින මට්ටමට වඩා, වසර 2030 වන විට 20%කින් පහත හෙළීම.

   - පූර්ණ කාබන්හරණයට එළඹීම පිළිබඳ ශ්‍රී ලංකාවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සහ වසර 2050 වන විට සියළු බලශක්ති අගය දාමයන්වල පූර්ණ පරිවර්තනයක් සිදු කිරීම.

2. විදුලියන මට්ටම 99.9 % දක්වා වර්ධනය කිරීම

3. විදුලිය ජනනය සඳහා පුනර්ජනනීය බලශක්තියේ දායකත්වය ආකර්ශනීයව පවත්වා ගැනීම.

වර්ෂය	පුනර්ජනනීය බලශක්ති දායකත්වය
2018	44%
2019	35%
2020	54%

4. සූර්යබල සංග්‍රාමය වැඩසටහන දියත් කිරීම
   2020 දෙසැම්බර් මස වන විට, "සූර්යබල සංග්‍රාමය" වැඩසටහන තුළින්, මෙගා වොට් 337 ක ධාරිතාවයකින් යුත් සූර්ය පියසි පද්ධති, විදුලි පාරිභෝගිකයන් 30,149 ක් විසින් ජනන පද්ධතියට එක් කර ඇත.

5. මන්නාරම මෙගා වොට් 100 සුළං බල ගොවිපල ඉදි කිරීම.
   මෙම සුළං බල ගොවිපල 2020 දෙසැම්බර් මස 08 දින වැඩ නිම කර ජාතික පද්ධතියට එක් කර ඇති අතර, එහි පළමු අදියරේදී මෙගා වොට් 30 ක් ජාතික ජාලයට එක් කර ඇත.

6. මොරගොල්ල මෙගා වොට් 31 ජල විදුලි බලාගාරය ඉදි කිරීම.
   ඉදි කිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, 2023 ඔක්තෝබර් මස වන විට ජල විදුලි බලාගාරයේ විදුලි ජනනය ආරම්භ කිරීමට අපේක්ෂිතය.

7. පුනරීන්හි මෙගා වොට් 240 සුළං හා මෙගා වොට් 150 සූර්ය දෙමුහුම් බලශක්ති උද්‍යානය
   ව්‍යාපෘතියේ මුල් අදියර ලෙස මෙගා වොට් 50 ක සූර්ය බලධාරිතාවක් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය සැලසුම් කර ඇත. ඉඩම් අත්පත් කර ගැනීම, සමාජීය හා පාරිසරික බලපෑම් ඇගයීම සහ භූ තාක්ෂණික සමීක්ෂණය ආරම්භ කිරීමට අපේක්ෂිතය.

8. මෙගා වොට් 1 බැගින් වන සූර්ය බලාගාර ඉදි කිරීම.
   මෙගා වොට් 1 බැගින් වන සූර්ය බලාගාර වැඩසටහන යටතේ, පළමු අදියර ලෙස, ව්‍යාපෘති 37 ක ඉදි කිරීම් කටයුතු සිදු කරමින් පවතී. මෙහි දෙවන අදියරේදී ව්‍යාපෘති 90 ක් ඉදි කිරීමට නියමිතව ඇත.

9. වවුනතිවිහි මෙගා වොට් 10 බැගින් වන සූර්ය බලාගාර 02ක් හා චුන්නාකම්හි මෙගා වොට් 10 බැගින් වන සුළං බලාගාර 02ක් ඉදි කිරීම.

10. බලශක්ති කාර්යක්ෂමතා කාර්යයන් වර්ධනය කිරීම.
    "ශක්ති" LED පහන් බෙදා දීමේ වැඩසටහන ආරම්භ කර ක්‍රියාත්මක කෙරෙමින් පවතී. ඒ යටතේ මේ වන විට LED පහන් 700,000කට ආසන්න ප්‍රමාණයක් විදුලි පාරිභෝගිකයින් අතර බෙදා දී ඇත.

අභියෝග

1. පුනර්ජනනීය බලශක්ති සංකලනයේදී ජාලයට ආධාර වන සහායක පද්ධති ප්‍රමාණවත් නොවීම නිසා වන තාක්ෂණික අභියෝග .
2. පුනර්ජනනීය බලශක්තිය ඉල්ලුම මත පවතින අතර ඒ සඳහා ගබඩා පහසුකම්, පිරිවැය ඵලදායී බැටරි හා පොම්ප ජල පහසුකම් අවශ්‍ය වේ.
3. පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්හි මිල අධික වීම
4. පුනර්ජනනීය බලශක්ති සංවර්ධන කාර්යයන් සඳහා මහා පරිමාණයේ ආයෝජනයන් අවශ්‍ය වීම
5. දේශගුණික විපර්යාස
   - කාලගුණයෙහි අවිධිමත්භාවය, ජල විදුලි ජනනය, ජෛව ස්කන්ධ නිෂ්පාදන හා කෘෂිකාර්මික අවශේෂ මගින් විදුලි ජනනය සඳහා තදින් බලපායි.
6. පුනර්ජනනීය බලශක්ති ජනනයේදී ඇතිවන සමාජීය ගැටළු
   - වන ජීවීන් හා වනාන්තර සම්බන්ධ ගැටළු
   - ගම්වාසීන් සමග ඇතිවන ගැටළු
7. කාබන්ඩයෝක්සයිඩ් (CO_2) මට්ටම අඩු කිරීම පිළිබඳව ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන්ට (NDC) අදාළ ඉලක්ක, 2030 වර්ෂය වන විට සපුරා ගැනීමට කටයුතු කිරීම.
   - 4% කොන්දේසි විරහිතව පාරිසරික කාබන්ඩයෝක්සයිඩ් විමෝචන අඩු කිරීම
   - 16% අන්තර්ජාතික සහයෝගීතා තත්ව යටතේ පාරිසරික කාබන්ඩයෝක්සයිඩ් විමෝචන අඩු කිරීම

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	12	05	07
තෘතීයික	-	-	-
ද්විතියික	21	11 *	06 **
ප්‍රාථමික	19	14 *** ****	03
තාවකාලික	04	01	03

* මීට අමතරව උපාධිධාරී අභ්‍යාසලාභීන් 05 දෙනෙකු අනුයුක්ත කර ඇත.

** කළමනාකරණ සේවා නිලධාරී පුරප්පාඩු 06 කි.

*** මින් එක් රියදුරු මහතකු විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ඇත.

**** මීට අමතරව අනියම් රියදුරු මහතුන් දෙදෙනෙකු ඇත.

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ආයතනයේ මානව සම්පත් හිඟය කාර්ය සාධනය උදෙසා අහිතකර ලෙස බලපෑම වැළැක්වීමට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු දෙකක රාජකාරී ආවරණය කිරීමට නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇත. එසේම අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාවට අදාළව ඒ ඒ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් සිදු කර ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

පවතින කොරෝනා වසංගත තත්වය හේතුවෙන් වැඩසටහන් පවත්වා නොමැත

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	2020.08.09 දිනෙන් පසු කාලසීමාව සඳහා විගණන විමසුම් ඉදිරිපත් වී නොමැත.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	2020.08.09 දිනෙන් පසු කාලසීමාව සඳහා විගණන විමසුම් ඉදිරිපත් වී නොමැත.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		

2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම			
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම			
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම			
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තමේන්තුවට ඉදිරිපත් කිරීම			

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	2020.08.09 දිනෙන් පසු කාලසීමාව සඳහා විගණන විමසුම් ඉදිරිපත් වී නොමැත.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	2020.08.09 දිනෙන් පසු කාලසීමාව සඳහා විගණන විමසුම් ඉදිරිපත් වී නොමැත.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	2020.08.09 දිනෙන් පසු කාලසීමාව සඳහා විගණන විමසුම් ඉදිරිපත් වී නොමැත.		
6.4	මුදල් රෙගුලාසි 134(3) අනුව, ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	2020.08.09 දිනෙන් පසු කාලසීමාව සඳහා විගණන විමසුම් ඉදිරිපත් වී නොමැත.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම	අදාළ නොවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම	අදාළ නොවේ		

	සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තෙරෙතුරු කොමිප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අදාළ නොවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අදාළ නොවේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		

10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම්	අනුකූල වේ		

	දෙපෙර්තමේතුවට ප්‍රේෂණය කර තිබීම			
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමව ඉක්මවා නොයන පරිදි තත්කාර්ව අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමවා තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	තනතුරු බොහොමයක් පුරප්පාඩුව පවති	පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් සිදු කර ඇත.
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රෙල්ඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැත.	සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු මේ වන විට සිදු කරමින් පවති
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු	අනුකූල වේ		

	නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාශය සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට නොමැත.	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව අමාත්‍යාංශය සඳහා පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවති
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු	අනුකූල නොවේ	අමාත්‍යාංශ මානව සම්පත් සැලැස්ම තුල සෑම සාමාජිකයෙකු	

	අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම		සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් තහවුරු කර නැත	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශ මානව සම්පත් සැලැස්ම තුල සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර නැත	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ	මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර නැත.	
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අමාත්‍යාංශය 2020.08.09 දින පිහිටුවන ලද බැවින් අදාළ නොවේ.		

සූර්ය බල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
437, ගාලු පාර, කොළඹ 03.

දුරකථන: +94 112 57 4922 ෆැක්ස්: +94 112 57 4915 / +94 256 5080
info.smre@powermin.gov.lk
www.powermin.gov.lk